සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## නාට්‍ය හා රංගකලාව - I

12 ශ්‍රේණිය

කාලය පැය 01 යි.

උපදෙස් :-
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට අයත් අංකය ඉදිරියෙන් ඇති වරහන් තුළ දක්වන්න.

---

(01) රංගනයට වඩා ගායනයට ප්‍රධාන තැනක් ගන්නේ,

(1) කබුකි නාට්‍යයේ ය. (2) නෝ නාට්‍යයේ ය. (3) බෙයජිං ඔපෙරාවේ ය.
(4) බැලේ නාට්‍යයේ ය. (5) ග්‍රීක නාට්‍යයේ ය. (......)

(02) ප්‍රාසාංගික කලා ගොන්නට වැටෙයි.

(1) නර්තනය, සංගීතය, නාට්‍යය. (2) කැටයම්, මූර්ති, නර්තනය. (3) චිත්‍ර, සංගීතය, නාට්‍යය.
(4) චිත්‍ර, මූර්ති, කැටයම්. (5) සිනමාව, නාට්‍ය, නර්තනය. (......)

(03) 16 වන ශත වර්ෂයේ දී ඉතාලියේ හා ප්‍රංශයේ බිහි වී 19 වන ශතවර්ෂය වන විට ලොව පුරා පැතිරුණු සම්භාව්‍ය නාට්‍ය විශේෂයකි,

(1) ඔපෙරා (2) බැලේ (3) ග්‍රීක (4) මුද්‍රා (5) නෘත (......)

(04) නිර්මාණාත්මක වුත් ව්‍යවහාරික ප්‍රයෝජනයට ගත හැකි කලා,

(1) උපයෝගීතා කලා (2) ජන කලා (3) රංග කලා
(4) ප්‍රාසාංගික කලා ( 5 ) ල ලි ත ක ල ා
(......)

(05) සබරගමු කිරිමඩුවක අන්තර්ගත නාට්‍යමය අවස්ථා වන්නේ,

(1) මරා ඉපැද්දීම, අඹ විදමන, ඇත් බන්ධනය, මී බන්ධනය.
(2) වඩිග පටුන, දොලහ පෙළපාලිය, රාම මැරීම.
(3) මරා ඉපැද්දීම, අඹ විදමන, රාම මැරීම, ඇත් බන්ධනය.
(4) ඌරා යක්කම, ආවැන්දුම, අස්නේ.
(5) නානුමුරය, කපුයක් කංකාරිය, දරු නැළවිල්ල. (......)

(06) හෙන්රික් ඉබ්සන්ගේ නාට්‍ය නිර්මාණය,

(1) චෙරි උයන (2) බෝනික්කිගේ සෙල්ලම් ගෙය
(3) ගොඩෝ එනකං (4) මකරා (5) ඇජැක්ස් (......)

(07) ට්‍රැජඩියක මූලිකාංග ගණන,

(1) 06 (2) 02 (3) 04 (4) 08 (5) 09 (......)

(08) කොහොඹා කංකාරියේ නාට්‍යමය අංගයක් නොවන්නේ,

(1) ඌරා යක්කම (2) ගබඩා කොල්ලය (3) ආවැන්දුම

(4) ගුරුගේ මාලාව (5) නයා යක්කම (......)

(09) ''ආකුලීකරණය'' යන්නෙහි අදහස වන්නේ,

(1) ගැටුම සමථයකට පත්වීම. (2) ගැටුමේ උච්චතම අවස්ථාවයි.

(3) ගැටුම ආරම්භයයි. (4) සිද්ධි මාලාවේ පරිවර්තනයයි.

(5) භාව විශෝධනයයි. (......)

(10) පාස්කු දර්ශන පවත්වන්නේ,

(1) ජේසුස් වහන්සේගේ උපත් කථා (2) වීර කථා (3) බෞද්ධ කථා

(4) පුරාණ කථා (5) සුරඟන කථා (......)

(11) පාස්කු ප්‍රචලිත ප්‍රදේශයක් නොවන්නේ,

(1) පිටිපන (2) දූවේ (3) යාපනය (4) බේරුවල (5) පමුණුගම (......)

(12) කෝලම් රංග ශෛලිය,

(1) නාට්‍ය ධර්මී වේ. (2) මිශ්‍ර වේ. (3) ලෝක ධර්මී වේ.

(4) ඊටම ආවේනික ශෛලියක් ඇත. (5) අර්ධ ශෛලිගත වේ. (......)

(13) ''අවස්ථානු කෘතීර් නාට්‍යම්'' යන ප්‍රකාශය කරන ලද්දේ,

(1) ධනංජය පඬිවරයා ය. (2) විශ්ව නාථ පඬිවරයා ය. (3) භරත මුනිවරයාය.

(4) කාලිදාස ය. (5) භාස ය. (......)

(14) ඇරිස්ටෝටල් නම් දාර්ශනිකයා ජීවත් වූ කාලය සේ ගැනෙන්නේ,

(1) ක්‍රි.පූ. 4 වන සියවස. (2) ක්‍රි.පූ. 2 වන සියවස. (3) ක්‍රි.පූ. 3 වන සියවස.

(4) ක්‍රි.පූ. 1 වන සියවස. (5) ක්‍රි.පූ. 6 වන සියවස. (......)

(15) ''ට්‍රැජඩි යනු උත්තුංග ක්‍රියාවක් අනුකරණයක්'' යනුවෙන් සඳහන් වන්නේ,

(1) නාට්‍ය ශාස්ත්‍රයේ ය. (2) කාව්‍ය ශාස්ත්‍රයේ ය. (3) සමාජ කුළුණුයේ ය.

(4) ඇන්ටගනී තුළ ය. (5) ඊඩිපස් නාට්‍යයේ ය. (......)

(16) ''ප්‍රත්‍යාවර්තනය'' යනු,

(1) භාව විශෝධනයයි. (2) කථා වින්‍යාසයේ ඵල ප්‍රාප්තියයි.

(3) අනපේක්ෂිත ගැටලු මතුවීම යි. (4) කාල ඒකීයත්වය යි.

(5) රස ජනනයයි. (......)

(17) ''අර්ථ ප්‍රකෘති'' ගොන්නට අයත් නොවන්නේ,

(1) බීජ (2) බිංදු (3) පතාකා (4) ප්‍රකරි (5) ඵලාගම (......)

(18) ''නේතෘ'' යනු,

(1) කතා නායකයයි. (2) කතා නායිකාවයි. (3) පොතේගුරාය.

(4) නළුවන් ය. (5) ප්‍රේක්ෂකයින් ය. (......)

(19) ''ඉතිවෘත්තය'' බෙදෙන කොටස් ගණන කීයද?

(1) 02 (2) 01 (3) 03

(4) 04 (5) බෙදෙන්නේ නැත (......)

(20) ''සුභ සහ යස'' නාට්‍යයට අදාළ මූලාශ්‍රය සපයා ගෙන ඇත්තේ,

(1) මහා වංශයෙනි. (2) ථූප වංශයෙනි. (3) සද්ධර්ම රත්නාවලියෙනි.

(4) ජාතක කතා පොතෙනි. (5) නාට්‍ය ශාස්ත්‍රයෙනි. (......)

(21) රූපණ විධි ක්‍රමය හඳුන්වාදෙන ලද්දේ,

(1) භරත මුනි (2) ඇරිස්ටෝටල් (3) එදිරිවීර සරච්චන්ද්‍ර
(4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (5) ස්ටැනිස්ලව්ස්කි (......)

(22) ''දුරස්ථකරණ රංග රීතිය'' හඳුන්වාදෙන ලද්දේ,

(1) ස්ටැනිස් ලව්ස්කි (2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (3) ඇරිස්ටෝටල්
(4) භරතමුනි (5) හෙන්රි ජයසේන (......)

(23) නාට්‍යමය ලක්ෂණ අඩංගු බෞද්ධ පූජා කර්මයක් නොවන්නේ,

(1) යුගාසන බණ (2) සූවිසි විවරණ (3) මිලින්ද ප්‍රශ්නය
(4) ඌරා යක්කම (5) දොරකඩ අස්නය (......)

(24) අභිනය සංකල්පය මුලින් ම හඳුනාගනු ලැබූයේ,

(1) ග්‍රීක නාට්‍යයේ ය. (2) කබුකි නාට්‍යයේ ය. (3) සංස්කෘත නාට්‍යයේ ය.
(4) යුරෝපා නාට්‍යයේ ය. (5) දේශීය නාට්‍යයේ ය. (......)

(25) සංස්කෘත නාට්‍යයේ කතා නායක, නායිකා සම්බන්ධ වන ප්‍රධාන කථා පුවත හඳුන්වන්නේ,

(1) විශ්කම්භ (2) ආධිකාරික (3) අංකමුඛ (4) ප්‍රාසාංගික (5) ආරම්භ (......)

The National e-learning Portal for The General Education

- **පහත වගුව ඇසුරෙන් අංක 26 සිට 29 දක්වා වූ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | I | සුගතපාල ද සිල්වා | II |
| III | සොෆොක්ලීස් | IV | බෙරහඬ |

(26) ඉහත වගුවේ අංක (I) ට අදාළ පිළිතුර වන්නේ,

(1) සොෆොක්ලීස් (2) ටෙනිසි විලියම්ස් (3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
(4) ඇන්ටන් චෙකොෆ් (5) ඉයුජින් අයනෙස්කෝ (......)

(27) අංක (II) ට අදාළ පිළිතුර වන්නේ,

(1) සකලජන (2) මහගෙදර (3) රෝමය ගිනි ගනී
(4) හිත හොඳ අම්මණ්ඩි (5) සුබ සැන්දෑවක් (......)

(28) අංක (III) ට අදාළ පිළිතුර වන්නේ,

(1) යෙර්මා (2) ඉග්නෙව්ටායි (3) ද ලෝවර් ඩෙප්ත්ස්
(4) රූඩන්ස් (5) කැට් ඔෆ් ද හොට් ටින් රූෆ් (......)

(29) (IV) ට අදාළ පිළිතුර වන්නේ,

(1) ගුණසේන ගලප්පත්ති (2) රංජිත් ධර්මකීර්ති (3) බන්ධුල ජයවර්ධන
(4) එදිරිවීර සරච්චන්ද්‍ර (5) බන්ධුල විතානගේ (......)

(30) භරතමුනිගේ රස සංකල්පයට (නව නළු රසයට) තවත් එක් රසයක් එක් කළ නාට්‍යකරුවා වන්නේ,

(1) භාස (2) කාලිදාස (3) ශුද්‍රක
(4) ධනංජය (5) අභිනවගුප්ත (......)

(31) ග්‍රීක ට්‍රැජඩියක මූලික ලක්ෂණයක් වන්නේ,

(1) නාට්‍යය අවසානයේ කථානායකයා ඛේදජනක ඉරණමකට ගොදුරු වීම.

(2) කථානායකයා ඔහු අතින් සිදුවන අත්වැරැද්දක් නිසා ඛේදජනක ඉරණමකට ගොදුරු වීම.

(3) කතා නායකයා යහපත් අයෙකි.

(4) කථාව පශ්චාත් දෘෂ්ඨී කථන ක්‍රමයට ගොඩනැගී ඇත.

(5) උපරිම නළුවෝ තිදෙනෙකි. (......)

(32) නාඩගමේ විශේෂ ලක්ෂණය නොවනුයේ,

(1) නිශ්චිත පෙළක් නොමැති වීමය. (2) පොතේගුරු සිටීම ය.

(3) කර්ණාටක සංගීතය යොදාගැනීමය. (4) පිරිමින් පමණක් රඟපෑමයි.

(5) පූර්ව රංගනයකින් නාට්‍යය ආරම්භය යි. (......)

(33) නාඩගම් පිරිහීමට හේතු වූයේ,

(1) නාඩගමට එරෙහිව සමාජ මතවාද ගොඩනැගීමයි.

(2) ඒකාකාරී උත්තර භාරතීය සංගීතය යොදාගැනීමයි.

(3) නූර්ති ආගමනයයි.

(4) නළු වෘත්තිය පිරිහීමයි.

(5) දිනපතා ම පූර්ව රංගනයකින් පසු නාඩගම් ඉදිරිපත් කිරීමයි. (......)

(34) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍යයේ පුරෝගාමියෙකි,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) ශ්‍රී නිශ්ශංක (3) ලූෂන් ද සොයිසා

(4) වී. ආරියරත්නම් (5) ලක්ෂ්මී ද සිල්වා (......)

- **පහත වගුව ඇසුරෙන් පහත 35 - 39 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| A | හැරමිටිය | B | තයිකෝ |
| C | එකුක්ලීමා | D | කයිතාලම |
| E | වංගෙඩිය | F | මෝල්ගහ |
| G | ඩෝල්කිය | H | ඔන්කෝස් |
| I | පන්හිඳ | J | පුස්කොළ පත් ඉරු |

(35) ජපන් නාට්‍ය සඳහා වාදනය කළ බෙරයකි,

(1) A (2) B (3) G (4) D (5) H (......)

(36) ''සෙල්ල පිල්ලේ'' භාවිතා කළ රංග භාණ්ඩය නම්,

(1) I හා J (2) A හා J (3) E හා H (4) D හා G (5) F හා J (......)

(37) ග්‍රීක නාට්‍ය සම්ප්‍රදායට අයත් නාට්‍යෝපකරණ වනුයේ,

(1) BI (2) CH (3) BF (4) CD (5) BH (......)

(38) කෝලම් නාට්‍ය සඳහා භාවිතා වන රංග භාණ්ඩයකි,

(1) D (2) G (3) F (4) A (5) E (......)

(39) උඩරට ජන නාටකයට අයත් වේ,

(1) GD (2) BF (3) AH (4) EF (5) DF (......)

(40) ''සොකරි'' රඟ දැක්වූයේ,

(1) තානායම් පොළ (2) කමත (3) වෙරළාශ්‍රිතව

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## නාට්‍ය හා රංගකලාව - II

12 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

සැලකිය යුතුයි :-

- **A කොටසින් ප්‍රශ්න 02 ක් ද, B කොටසින් ප්‍රශ්න 02 ක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

---

### A කොටස

(01) (i) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ප්‍රධාන ශාන්ති කර්ම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල.03)

(ii) ඉන් එක් ශාන්ති කර්මයක නාට්‍යමය පෙළපාලියක් නම් කොට එහි ලක්ෂණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න. (ල.06)

(iii) සබරගමු පළාතේ දේව කොවිලයක් නම් කොට ඒ පිළිබඳ විස්තර කරන්න. (ල.06)

(02) (i) නාඩගම් කලාව පිරිහීමට හේතු වූ කරුණු 04 ක් කෙටියෙන් පෙන්වා දෙන්න. (ල.04)

(ii) නූර්ති ජනප්‍රිය වීමට හේතු වූ කරුණු පෙන්වා දෙන්න. (ල.05)

(iii) නූර්ති වලින් පසුව සිංහල නාට්‍ය කලාව පරිහානියට හේතු වූ කරුණු දක්වන්න. (ල.06)

(03) (i) ''අර්ථ ප්‍රකෘති'' නිදසුන් ඇසුරෙන් පහදන්න. (ල.04)

(ii) ''කාර්ය'' බෙදෙනාකාරය පැහැදිලි කරන්න. (ල.05)

(iii) ''ඉකිවෘත්තය'' පිළිබඳ විග්‍රහ කරන්න. (ල.06)

### B කොටස

(04) (i) ප්‍රාසාංගික කලාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කවරේ ද? (ල.04)

(ii) ප්‍රාසාංගික කලා ගොන්නට වැටෙන අනෙකුත් කලාංගයන් 02 ක් නම් කොට ඒ දෙක අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ල.05)

(iii) ප්‍රාසාංගික කලාව අතර නාට්‍ය කලාව දරණ සුවිශේෂීත්වය පිළිබඳ සාකච්ඡා කරන්න. (ල.06)

(05) (i) ත්‍රිවිධ ඒකීයත්වය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ල.04)

(ii) ග්‍රීක නාට්‍ය කලාවේ ත්‍රිවිධ ඒකීයත්වය රැකී ඇති අවස්ථා නිදසුන් සහිතව පහදන්න. (ල.05)

(iii) ට්‍රැජඩියක මූලිකාංග නම් කොට කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

(06) (i) අභිඥාන ශාකුන්තලයට පදනම් වූ මූලාශ්‍රය කෙටියෙන් දක්වන්න. (ල.04)

(ii) පෙළ රචනයේ දී ඊට කර ඇති වෙනස්කම් පහදන්න. (ල.05)

(iii) ඔබ සකුන්තලා නාටකය දකිනා ආකාරය නූතන සමාජය සමග සන්සන්දනය කරමින් විග්‍රහයක යෙදෙන්න. (ල.06)